www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ඝාතනය පිලිබඳව ලද ලිපි සහ සැපයුන පිලිතුරු

## Letters and replies on the assassination of Sri Lankan foreign minister

**2005 සැප්තැම්බර් 05**

*පහත දැක්වෙන ලිපි 2005 අගෝස්තු 26 වන දා (ඉංග්‍රීසි භාෂාවෙන්) පල වූ 'ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ඝාතනය පිලිබඳව පිලිතුරු ලැබී නැති ප්‍රශ්න' නම් ලිපියට ප්‍රතිචාර ලෙස ලෝක සමාජවාදී වෙබ් අඩවිය ට එවා තිබින. ලිපියේ එක් කතුවරයකු වූ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික කේ. රත්නායක සැපයූ පිලිතුරු ද ඒ සමග පල වේ.*

නිර්භය විශ්ලේෂනයක් සහිත ශ්‍රේෂ්ඨ ලිපියකි. බටහිර ලොව වෙසෙන බොහෝ ශ්‍රී ලාංකිකයෝ ඔබගේ ලිපිය ඔවුනොවුනට ඊ-මේල් කරන අතර ඔබගේ අපක්ෂපාතී ස්ථාවරය පිලිබඳව ප්‍රසංසාත්මක වෙති.

සී ඩබ්ලිව්. - ටැන්සානා, ඇමරිකා එක්සත් ජනපදය.

෴ ෴ ෴

යෝග්‍ය ලේඛන කලාවේ සම්ප්‍රදායයන් අනුයන ලේඛකයින් ප්‍රධාන ධාරාව තුල තවමත් සිටීම සැනසිල්ලක් දනවයි.

ඩබ්ලිව් ටී. - යැන්ගුන්, මියන්මාරය.

---

ඔබගේ අගය කරන්නාවූ ඊ-මේල්වලට ස්තුතියි. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සාමාන්‍යයෙන් වචනය ව්‍යවහාර වන ආකාරයට අනුව ''ප්‍රධාන ධාරාව''ට අයත් නො වන අතර එය සමාජවාදී ප්‍රකාශයකි. ශ්‍රී ලංකාවේ සිදු වීම් පිලිබඳව වූ විෂයබද්ධ වූ විස්තරයක් සැපයීම අන් කිසිදු අයකුට නොහැකි වීම පිලිබඳ කාරනාව ප්‍රධාන ධාරාවේ මාධ්‍යයන්ට එල්ල වන චෝදනා පත්‍රයකි. ශ්‍රී ලංකාව තුල වර්ගවාදී දේශපාලනයේ ගිලී ඇති සිංහල හා දෙමල මාධ්‍යයන් තුල එක ලෙසට ම මෙම තත්වය දැඩි ලෙසින් ම පෙශී ගොස් ඇති අතර අති මූලික කාරනාවන් පවා අගතිගාමී නො වී වාර්තා කිරීමේ ලා ඓන්ද්‍රියව ම අපොහොසත් ය. ජාත්‍යන්තර මාධ්‍යයන් කොලඹින් පැවසෙන දෙය වන, කදිරගාමර් මරා දැමීමට දෙමල ඊලම් විමුක්ති කොටි වගකිව යුතු ය යන්න, අවිවේචනාත්මකව ඔහේ පුනරුච්චාරනය කරති.

කේ. රත්නායක.

෴ ෴ ෴

මේ හරියටම මම මගේ සියලු සිංහල මිතුරන්ට පැවසූ දෙයම ය. එල්ටීටීඊයට, ජනාධිපතිනියට සහ විපක්ෂ නායකයාට බොහෝ අවාසි ඇති කරවූ අතරේ සඳහන් කරන ලද පක්ෂවලට සහ ජාතිකවාදී (ස්වෝත්තමවාදී) අගමැතිට ආයුධ වෙලෙන්දන්ටද සමග බොහෝ වාසි ඇති වේ.

එස් එස්.

෴ ෴ ෴

මෙම අපරාධයෙන් එල්ටීටීඊය නිදොස් කරලීමට ඔබ මහත් වෙහෙසක් දරා තිබේ. මෙම නීච ක්‍රියාව සිදු කල උදවිය පිලිබඳව නිශ්චිත සාධක තවමත් ලැබෙමින් පවතින බව පිලිගනු ලැබෙන්නේ නමුදු ඔබ අනුමාන හේතු (ඒ කිසිවක් නිශ්චිත නොවේ) දෙමින් අනෙක් පාර්ශ්වයන් පැටලවීමට උපරිම වෑයම දරයි. ඔබ සුනිල් හා රත්නායක යන නම් ගොතා ගත් ඒවා බවට ද ඔබලා සමාජවාදීන් නොව ත්‍රස්තවාදීන් බවට ද මට දැඩි ලෙස හැඟෙයි. ඒ කෙසේ වෙතත් ඔබ සත්‍ය ලෙසින් ම මෙම නම් දරන්නේ නම් හා එල්ටීටීඊ හිතවතුන් වන්නේ නම් ඔබලා වැදූ මවුවරුන්ගේ ගැබටද ඔබලා අවමානයකි. ඔබ ''ලෝක සමාජවාදී වෙබ් අඩවියක්'' නියෝජනය කරන්නේ නම් ද එම සංවිධානයෙන් ඔබ වැනි අයට ඉඩ කඩ සලසන්නේ ද නම් ඔබලාගේ වර්ගයේ සමාජවාදයක් පිලිබඳව මම අනුකම්පා කරමි.

සී ඩී.

---

දයාබර සීඩී,

ඔබගේ ලිපිය තුලින් දේශපාලනයේ පමනක් නොව ශ්‍රී ලංකා ජන ජීවිතයේ සියලු අංශයන්හි පැතිර පවත්නා විෂ ඝෝර වර්ගවාදය පිලිබඳව පැහැදිලි උදාහරනයක් සපයා තිබේ. ඔබගේ තර්කයේ ප්‍රවිශ්ඨය වනුයේ විදේශ

ඇමති කදිරගාමර් ඝාතනය එල්ටීටීඊය විසින් කල බව ස්ථිරය යන්න වුව ද ඔබ ඔබගේ ස්ථිරසාර පිලිගැනීමට බිංදු මාත්‍රයක් වත් සාක්ෂියක් ඉදිරිපත් නොකරයි. අප ඔබ මෙන් නිගමනයන්ට පැන ගෙන නොයන බවත් එල්ටීටීඊය මෙම මිනීමැරුම කරන්නට ඉඩ ඇති බව ප්‍රකාශ කල වගත් ඔබ ඔබට ගැලපෙන අයුරු නොතකා හරී. ඔබ ඒ වෙනුවට ජාතිවාදී ගර්හාව හා අවලාදය යොදා ගනී. ඔබගේ කල්පනාවට අනුව ඔබගේ ස්වෝත්තමවාදී නිගමනයන්ට සහාය දීමට අපොහොසත් වන ඕනෑම සිංහලයෙකු ද්‍රෝහියෙකු වේ, ඔවුන්ගේ මවුවරුන්ට ද අවමානයකි. ඇත්ත වසයෙන් ම සියලු ම රූපාකාරවල ජාතිකවාදයන්ට සහ ජාතිවාදයන්ට විරුද්ධ වීම අති මූලික කාර්යයක් ලෙස ගැනෙන්නා වූ ජාත්‍යන්තරවාදය මත පදනම් වූ සමාජවාදය හැර වෙනත් ''මාදිලි'' නැත. අර්ථභාරී ලෙසට එල්ටීටීඊය ද අතීතයේ දී අපට විරුද්ධව මෙවැනි ම අවලාද දෙඩූහ. 1998 දී ඔවුහු ඔබගේ දේශපාලනයේ හුදු දර්පන පිලිබිඹුව වන ඔවුන්ගේ වර්ගවාදී දේශපාලනයට විරුද්ධ වීම නිසා අපගේ සාමාජිකයන් සිරගත කලහ.

කේ. රත්නායක.

෩ ෩ ෩

සිංහල පාඨකයින් ඔබගේ ලිපි කියවීමට කැමැත්තක් නොදක්වයි. ඔවුන් ලිඳේ සිටින ගෙම්බෙකු වැනි ය. මෙම සිංහල ශ්‍රී ලාංකිකයන්ට විශ්ලේෂනාත්මක නිපුනතාවය නැත. ලංකාවේ තිබෙන ප්‍රශ්නය එය යි. දේශීය සහ ලෝක තත්වය පිලිබඳව ඔවුන්ට අවබෝධයක් නැතිකම නිසා ඔවුහු අපගේ රට විනාශ කරති. කෙසේ වෙතත් ඔබගේ කාර්යය දිගට ම කරගෙන යන්න. ස්තුතියි

කේ එන්. කොලඹ, ශ්‍රී ලංකාව.

---

අපි ඔබගේ අදහස් අගය කරන නමුත් ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන අර්බුදය අවබෝධය හෝ විශ්ලේෂනාත්මක නිපුනතාව නැති වීම නිසා පැන නැගුනක් නො වේ. මෙය සිංහල සේ ම දෙමල සහ මුස්ලිම් පාලක ප්‍රභූවේ කාලකන්නි දේශපාලනයේ ප්‍රතිඵලයකි. කම්කරුවන්ගේ සමාජ අවශ්‍යතා සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රාර්ථනාවන් ඉටු කර ලීම අත්‍යන්තයෙන් ම අපොහොසත් මොවුන් සියල්ලම තමන්ගේ තැන රැකගෙන ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රතිගාමී වර්ගවාදය කැලැත්තු හ. සාමාන්‍ය ශ්‍රී ලංකා වාසීන් අතර ව්‍යාකූලත්වය සහ වර්ගවාදී මනෝභාවයන් පැතිර ඇති ප්‍රමානයට පාලක පන්තීන් සහ ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන් (එල්ටීටීඊය ද ඇතුලත්ව) ඍජුව ම වග කිව යුතු ය.

කොලඹ ආන්ඩුව සේ ම එල්ටීටීඊයට ද කම්කරුවන්ට සහ ගම්බද දුගීන්ට දීමට කිසිවක් නැත. ඔවුන්ගේ යෝජනාව වන්නේ දිවයිනේ උතුරේ සහ නැගෙනහිර රාජ්‍ය-කැබැල්ලක් හෝ ප්‍රාන්ත ආන්ඩුවක් වන අතර එය විදේශීය ආයෝජකයන් සඳහා සූරාගත් ශ්‍රමය අඩුම ලංසුවට පුද කරනු ඇත. මිලිටරිය හෝ සිංහල ස්වෝත්තමවාදීන් හා සම්බන්ධිත කොටස් විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කලා විය හැකි බව පෙන්වා දීමේ දී අපි එය එල්ටීටීඊයෙන් කලා වීමට ඇති පැහැදිලි ඉඩකඩ බැහැර නොකරමු. අතීතයේ දී ශ්‍රී ලාංකීය නිලතල දරුවන් මරා දැමීම පිලිබඳව පමනක් නොව බොහෝ අහිංසක කම්කරුවන් මරා දැමීම පිලිබඳව ද, 1996 කොලඹ මහ බැංකුවට බෝම්බ ගැසීම වැනි දුෂ්ඨ අපරාධයන් පිලිබඳව ද ඔවුන් වග කිව යුතු ය. මෙයින් වූයේ සිංහල අන්තවාදීන්ට ඉනිමං සැපයුනා පමනකි.

ශ්‍රී ලංකාවේ ද වඩාත් පුලුල්ව ගත හොත් කලාපයේ ද කම්කරුවන්ට ගැලවීමට ඇති එකම මග ජාතිකවාදයේ ජාතිවාදයේ සහ වර්ගවාදයේ සියලුම රූපාකාරයන් ප්‍රතික්ෂේප කර සමාජවාදී රේඛා ඔස්සේ සමාජය යලි සැකසීම සඳහා ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ලෙස එක්සත් වීම ය. අඩ සියවසකටත් වැඩි කලෙක සිට එන දුෂ්ඨ වර්ගවාදී දේශපාලනය පන්ති හැගීම් මකා දමා නැති බවට සාක්ෂිය වනුයේ දෙසැම්බර් 26 සුනාමියෙන් පසු වහා ම එලඹුන කාලය තුල සිංහල කම්කරුවන් සහ තරුනයන් විපතට පත්වූවන්ගේ වාර්ගිකත්වය ආගම හෝ භාෂාව නොතකා ඔවුන්ට සහාය වීම පිනිස රටේ නැගෙනහිර දෙසට නොකඩවා ඇදී යාමය.

කේ රත්නායක.

෩ ෩ ෩

ඉතා සාධාරන අදහස් දැක්වීමකි. කෙසේ වෙතත්, සඳහන් කල පක්ෂ දෙක ඝාතනයේ වාසි ලබා ගත්තේ වුව ද කදිරගාමර් ද ආධාරවලට, සාම ක්‍රියාදාමයට සහ වෙඩි නැවැත්වීමට විරුද්ධ වීම නිසා මට 7 ඡේදය තේරුම් ගැනීම අපහසු ය. බෙහෙවින්ම ස්තුතියි.

එස් ජේ. ඕස්ට්‍රේලියාව.

---

යමෙකු ශ්‍රී ලංකාවේ දේශපාලනඥයින් කිසියම් හෝ කලෙක ගන්නා වූ ස්ථාවරයෙන් ඔවුන්ව වටහා ගැනීමට වෑයම් කලහොත් ඔහු මේ අයව එක්කෝ මුලුමනින් ම නොමග ගිය නැත හොත් පිස්සු වැටුන අය ලෙස නිගමනය කරනු ඇත. උදාහරනයක් ලෙස ජනාධිපති කුමාරතුංග සාමය දෙසමින් 1994 බලයට පැමිනි අතර ඊට පෙර තිබූ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) ට ද වඩා වැඩි මරන සහ විනාශයන්ට වග කිව යුතු ය. ඇයගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විපක්ෂයට වැටුන 2003 දී ඇය එල්ටීටීඊය සමග සාම කථා බහේ දී ජාතික ආරක්ෂාව බිඳ වැටෙන්නේ යයි එජාප ආන්ඩුව හෙලා දැකීමට ස්වෝත්තමවාදී ජනතා

විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග එකතු වූවා ය. 2004 පෙබරවාරියේ දී ඇය එම පදනම මත තනි මතයට ආන්ඩුව පලවා හැරියා ය. 2004 අප්‍රේල්වලදී ඇයගේ ශ්‍රීලනිප-ජවිපෙ සභාගය මැතිවරනය ජය ගත් විට වෙට්ටුවක් දමූ ඇය සාම ක්‍රියාදාමය යලි ඇරඹීමේ සිය අභිප්‍රාය ප්‍රකාශ කලා ය.

කුමාරතුංගගේ දඟර නැටීම් සහ හැරීම් සරලව ම චංචල පුද්ගලයෙකුගේ ප්‍රකාශන නොව එක් අර්බුදයක සිට ඊලඟට අර්බුදයට පෙරලී යාමේ දී කිසිදු විසඳුමක් නැති පන්තියක එනම් ධනේශ්වරයේ පරිහානිය පිලිබිඹු කරයි. ආර්ථිකය පැත්තෙන්, භූගෝලීයකෘත ධනපති නිෂ්පාදනයේ ක්‍රියාවලියට දිවයින සමෝධාන ගත කිරීම උදෙසා ව්‍යසනයක් වූ යුද්ධය අවසන් කර දැමිය යුතු බව ව්‍යාපාරික ප්‍රභූවට පැහැදිලිව තිබේ. කෙසේ වෙතත්, දේශපාලනිකව පාලක ප්‍රභූවන් වර්ගවාදයේ මඩ ගොහොරුවෙන් බේරී එලියට පැමිනීමට අපොහොසත් ය. එල්ටීටීඊය සමග ගනුදෙනුවක් දෙසට වන ඕනෑම ගමනක් කොලඹ විරුද්ධ පක්ෂ විසින් නිත්‍ය ලෙසින් ම ද්‍රෝහීකමක් ලෙස හෙලා දකිනු ලැබේ.

කදිරගාමර් පිලිබඳව බලමු. ඔහු පසු ගිය දශකයක තරම් කාලයක් පුරාවට තමන් කුමාරතුංගගේ කීකරු සේවකයා සහ රාජ්‍යතාන්ත්‍රික මෙවලම හා ඇගේ සමීපස්ථ හිතවතා බව ඔප්පු කර පෙන්වී ය. ඔහුට එල්ටීටීඊය සහ සාම ක්‍රියාදාමය හෙලා දකින ආකාරයට ම එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමේ ද හැකියාව සතු ය. ඔහුව මරා දමුන කාලයේ දී කුමාරතුංග ඔහුගේ සහාය ඇතිව සුනාමි ආධාර ඒකාබද්ධව බෙදා හැරීම සඳහා එල්ටීටීඊය සමග සැලැසමක් අනුමත කිරීමේ මහත් වෑයමක නිරතව සිටියා ය. ඇයගේ පෙර සගයින් -ජවිපෙ- සහ අන් ස්වෝත්තමවාදී සංවිධානවල මෙන් ම රාජ්‍ය තන්ත්‍රයේ කොටස්වලින් ද ඇයට විරුද්ධත්වයන් ආවේ ය.

මෙම සන්දර්භය තුල කුමාරතුංගගේ මුල්ම ප්‍රකාශය වන ''සාමයේ දේශපාලන සතුරන්'' ඝාතනයට වග කිව යුතු ය. යන්න අතිශයින් වැදගත් ය. දශකයකට අධික කාලයක් තිස්සේ ඉහල මිලිටරි නිලයන් සමග කුටෝපායන්ගේ යෙදී සහ අනුබල දෙමින් සිටි කුමාරතුංග සිත් බිඳුන මිලිටරි නිලධාරීන් මෙවැනි කුමන්ත්‍රනයන් සංවිධානය කිරීමට සමත් බව හොඳින් දැන සිටියා ය.

කේ රත්නායක.

ෆ ෆ ෆ

විමුක්ති කොටි සංවිධානය බෝම්බ ප්‍රහාරයක් හෝ ඝාතනයන් කල සෑම විට දී ම විමුක්ති කොටි සංවිධානයේ ක්‍රියා කලාපය ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ව දෝෂාරෝපනයෙන් ආරක්ෂා කිරීමට 'නැත' කියන්නවුන් සෑම විටම ඉදිරිපත් වේ. මෙහි දී යලිත් අපට හමු වන්නේ එවන් තත්වයකි. මා සිතන අයුරින් ඝාතනය කිරීමේ අවශ්‍යතාවය හා හැකියාව තිබුනේ විමුක්ති කොටි සංවිධානයට යි. ආන්ඩුව තුල ප්‍රබල තනතුරක් දරූ ද්‍රවිඩයකු බැවින් කදිරගාමර් මහතා කොටි සංවිධානයේ මූලිකම ඉලක්කය වී තිබිනි. තව දුරටත් ඔහුගේ ක්‍රියා කලාපය උදව්කාරක වූයේ අර්බුදය තුලට ජාත්‍යන්තර ප්‍රජාව සහභාගී කරවා ගැනීමට හා විමුක්ති කොටි සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස හඳුනාගැනීම සඳහා ය. ඔහු ද්‍රවිඩයකු වීම ම, ඔහුව ''ද්‍රෝහියෙකු'' ලෙස හංවඩු ගැසීමට විමුක්ති කොටි සංවිධානය, එහි හිතවතුන්ට සහ සගයන්ට ප්‍රමානවත් වේ. මෙමගින් එල්ලය තහවුරු වෙයි. අහිංසක ද්‍රවිඩයන් ත්‍රස්ත කොට හා තර්ජනයට ලක් කර ඔවුන්ගේ ත්‍රස්ත මෙහෙයුම් රහසිගතව කිරීමට ඉඩ සලසා ගැනීම පිලිබඳව කොටි සාමාජිකයන් ප්‍රසිද්ධියක් උසුලයි. මෙමගින් හැකියාව ලැබේ. කොටින් විසින් සිදු කරනු ලැබූ සියලු ම මහා පරිමානයේ ඝාතනයන් (සත්තකින් ම ඔහුගේ ම ඝාතනය හැරුනු විට) පිලිබඳව දෝෂාරෝපනය එල්ල වුනේ ජනාධිපති ප්‍රේමදාසට ය. එම සියලු ඝාතනයන් හා බෝම්බ ප්‍රහාර බියසුලු වේලුපිලේ ප්‍රභාකරන් සහ සමාගමේ ක්‍රියාවන් ය යන කරුන පිලිගැනීමට හා තේරුම් ගැනීමට මහජනයාට හැකි වූයේ කෙසේ ද? ඉදිරියට එන්න මිනිසුනි, අවදි වී රෝස සුවඳ ආඝ්‍රානය කරන්න. මා සිතන ලෙස, එය තාරාවකු ලෙස පෙනෙන්නේ නම්, තාරාවකු ලෙස ඇවිදින්නේ නම් හා තාරාවකු ලෙස හඬ නගන්නේ නම් එය තාරාවකු විය යුතු ය. එබැවින් කොටින්ට මින් ගැලවිය නොහැක.

ආර් ඩබ්ලිව්.

---

හිතවත් ආර් ඩබ්ලිව්,

මෙම තර්කනයෙන් ඔබ කිසිවක් ඔප්පු කරන්නේ නැත. වෙනස් කිරීමට අවශ්‍ය දෑ වෙනස් කරමින් ඔබගේ ඊ-මේල් පනිවිඩයේ ''විමුක්ති කොටි සංවිධාය''හා ''කොටි'' යන වචන ''මිලිටරිය'' හා ''ජවිපෙ'' යන වචනවලින් වෙනස් කල ද සමාන නිගමනයන්ට ලඟා විය හැකිය. ඔබගේ කතාව පිලිබඳව සාක්ෂි ඉදිරිපත් නො කරන ඔබ වාර්ගික පූර්ව නිගමනයට සරලව ම ආයාචනය කරයි. අනෙක් අය මෙන් ම ඔබ ද විමුක්ති කොටි සංවිධානය විසින් මෙම ඝාතනයන් සිදු කරන්නට ඉඩ ඇති බවට අප කල පැහැදිලි ප්‍රකාශය නොතකා හරියි. අපගේ ලිපිය ලියා ඇත්තේ කොලඹ මුද්‍රිත මාධ්‍යයන් තුල පලවුනු, යුද්ධයට යලි අවතීර්න වීමේ පසුබිම තලා පෙලා සකස් කර ගැනීම පැහැදිලිව එල්ල කර ගත් විමුක්ති කොටි සංවිධානය පිලිබඳ තහවුරු නොකල හෙලා දැකීම් සමුදායට විරුද්ධව ය.

එල්ලය සහ හැකියාව? මිලිටරියේ හා රාජ්‍ය උපකරනයේ ස්තරය ද , ජවිපෙ හා ජාතික හෙල උරුමය

ද, ආන්ඩුව හා විමුක්ති කොටි සංවිධානයඅතර ගිවිසුමක් ඇති වීමට, සුනාමි ආධාර ඒකාබද්ධව පරිපාලනය කිරීමට හා සාම ක්‍රියාවලිය යම් ලෙසකින් හෝ යලි ආරම්භ කිරීමට උන්මත්තක ලෙස ම විරුද්ධ ය. තව දුර සාකච්ඡා වලක්වා කුමාරතුංග හට අනතුරු සංඥාවක් යැවීමට, ඇයගේ සමීප විශ්වාස වන්තයෙකු ඝාතනය කොට වරද විමුක්ති කොටි සංවිධානය මත පැටවීමට වඩා හොඳ ක්‍රමයක් තිබිය හැකි ද? කාවැදී ඇති ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමට එවන් සැලසුමක් දියත් කිරීමට පමනක් නොව ඉන් ඔබ්බට වුව ද යන තරම් සැහැසි හැකියාවක් ඇති කොටස් දශක දෙකක යුද්ධය මගින් කොළඹ රාජ්‍ය උපකරනය තුල නිපදවා තිබේ.

අපගේ ලිපිය තුල මතු කර ඇති පිලිතුරු නොමැති ප්‍රශ්න පිලිබඳව ඔබට සඳහන් කිරීමට දෙයක් නොමැත. ශ්‍රී ලංකාව තුල අතිශයින්ම ආරක්ෂාවට පාත්‍ර වී සිටි දේශපාලන චරිතයකට ආසන්න වී ඔහු ඝාතනය කොට පිරිසිදුවම ගැලවී යාමට ඝාතකයින්ට හැකි වූයේ කෙසේ ද? ඔබ හෝ අන් කිසිවෙකු හෝ තවමත් මීට සතුටුදායක පිලිතුරක් සපයා නැත.

කේ රත්නායක.

෴ ෴ ෴

මෙම ලිපිය යථාර්ථයෙන් කුරිරු ත්‍රස්ත කල්ලියක් වන එල්ටීටීඊයට සුදුහුනු ගෑමට ගත් නිශ්ඵල වෑයමක් මිස අන් යමක් නො වේ. කුරිරු ත්‍රස්ත සංවිධානයක තුවක්කුව යට ජීවත්වන මිනිසුන්ට වඩා බොහෝ සෙයින් වෙනස්වූ ප්‍රජාතන්ත්‍රීයව තෝරා ගැනුනු ආන්ඩුවක් යටතේ ජීවත්වන මිනිසුන් අත්විඳින නිදහස අමතක කරන්න එපා.

එබැවින්, ලොව ප්‍රකට බොරුකාරයින්, මත්ද්‍රව්‍ය ප්‍රවාහකයින් සහ අපරාධවල මිනීමරු සැලසුම්කරුවන් වන මෙම ත්‍රස්ත එල්ටීටීඊයට ප්‍රජාතන්ත්‍රීය සමාජයේ හිඩැස්වලින් පහසුවෙන් රිංගා ඔවුන්ගේ සුපුරුදු ප්‍රතික්ෂේප කිරීම් පිටිපස සැඟවීමට හැකි බව පැහැදිලි ය. ශ්‍රී ලංකා විදේශ ඇමති ඝාතනයෙන් පසු ඔවුන් වහාම එලි දැක්වූ එල්ටීටීඊයේ පූර්ව සැලසුමේ ම සරල කොපියක් වන වැරදි තොරතුරුවලින් කථා ගෙතීමේ වෑයමේ ඔබගේ සැඟවුන අභිප්‍රාය ඔබේ ලිපිය ඇඟවුම් කරයි. වර්තමාන ජාත්‍යන්තර ප්‍රජාව මෙන්ම සාමයට ලැදි ශ්‍රී ලංකා දෙමල ජනයා යම් ත්‍රස්ත කන්ඩායමක හෝ ඔබ වැනි ඔවුන්ගේ සහායකයන්ගේ බොරු කියාපෑම් තව දුරටත් විශ්වාස කිරීමට තරම් මෝඩ නැත.

සී සී.

---

දයාබර සීසී,

සියල්ලට ම පලමු, සමාජවාදීන් ලෙස එල්ටීටීඊයට අපේ විරුද්ධත්වය බොහෝ වාරයක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබේ. විශේෂයෙන් ම අපගේ සමාජවාදී ක්‍රියාමාර්ගය වෙනුවෙන් උද්ඝෝෂනය කිරීම නිසා හිතුවක්කාරී ලෙස අත් අඩංගුවට ගැනුනු අපගේ සහෝදරවරුන් හතර දෙනකු නිදහස් කරන ලෙස එල්ටීටීඊයෙන් ඉල්ලමින් සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ ලොව වටා එහි සහෝදර පක්ෂ ගෙන ගිය දිග් ගැස්සුන උද්ඝෝෂනයෙන් අනතුරුව පල කැරුනු ''ජාත්‍යන්තර ආරක්ෂක උද්ඝෝෂනයේ ජයග්‍රහනය දෙමල අරගලය ශක්තිමත් කරයි: සසප සහ ශ්‍රී ලංකා සහ ඊලම් සමාජවාදී එක්සත් ජනපද සඳහා සටන'' නමින් වූ ප්‍රකාශයේ මෙය දීර්ඝව සටහන් කර තිබේ.

දෙවනුව, ඔබ ත්‍රස්තවාදයට විරුද්ධව ''ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක්'' ආරක්ෂා කරන්නේ යැයි කියාපෑම විකාරයකි. ආරම්භයේ සිට ම ශ්‍රී ලංකා පාලක ප්‍රභූවේ පක්ෂ ඔවුන්ගේ පාලනය ස්වෝත්තමවාදය සහ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම මත පදනම් කර ගති. 1948 බලයට පැමිනි එජාප ආන්ඩුවේ ප්‍රථම ක්‍රියාව වූයේ ඡන්ද දායකත්වයෙන් සියයට දහයක් දශලක්ෂයක් තරම් වූ දෙමල වතු කම්කරුවන් ''පරදේශක්කාරයින්'' ය යන පදනම මත ඔවුන්ගේ ඡන්ද බලය අහිමි කිරීම ය. එකකට පසු එකක් ආන්ඩු සහ රාජ්‍ය තන්ත්‍රය පැලපදියම් වූ මූලික දෘෂ්ටිවාදය වූයේ, අවසානයේ සිවිල් යුද්ධයට මග පෑදූ දෙමල විරෝධී වෙනස්කම් කිරීම ය. මෙම ''ප්‍රජාතන්ත්‍ර සමාජය'' පසු ගිය දශක දෙකින් වැඩි කාලයක් දහස් ගනන් එල්ටීටීඊ සැකකරුවන්'' හිතුමතේ රඳවා ගැනීමට ත් සමහර අවස්ථාවල දී වධ බන්ධනයට ලක් කිරීමට ත් අවකාශ සැලසූ හදිසි තත්වය සහ බිහිසුනු ත්‍රස්ත විරෝධී නීති යටතේ පවතී.

දැන් ''ප්‍රජාතන්ත්‍ර මැතිවරන''යේ සැරසිල්ල පවා සැක සහිත ය. පසු ගිය පස් වසරේ පැවැත්වූ මැතිවරන හතර පාලක පන්තියේ කිසිවක්ම විසඳා ලූයේ නැති අතර කොළඹ මුද්‍රිත මාධ්‍යවල වෙනත් ආකාරයක පාලනයක් පිලිබඳව විවෘත සාකච්ඡා පැවැත්වේ. පාලක ප්‍රභූවේ කොටසක් මෙම ඡන්දය ද ඇතුලුව ඡන්ද පැවැත්වීම මුලුමනින් ම අත හැර දැමීමට පෙරට පැමිනිය ද ඉන් අපි කිසි සේත් ම පුදුමයට පත් නොවෙමු.

කේ රත්නායක.

෴ ෴ ෴

ජවිපෙ සිංහල ස්වෝත්තමවාදී පක්ෂයක් ලෙස ඔබ තීන්දු කලේ කුමන පදනමක් මත ද කියා ඔබට අවංකව පැහැදිලි කල හැකි ද? සියලු ජාතීන්ට සහ ආගම්වලට සමානව ගරු කරන පක්ෂයක් වන ජවිපෙ විස්තර කිරීමට ඔබ වැරදි වචන භාවිත කරන්නේ ඇයි? ජවිපෙ ස්වෝත්තමවාදී පක්ෂයක් යයි පැවසීමට ඔවුන් පිලිබඳව

ඔබ දන්නා කරුනු මොනවා ද? ඔබලා මිනිසුන්ව රවටන්න තැත් කරන්නේ ඇයි? ඔබගේ අව්‍යාජ පිලිතුරක් බලා සිටිමි.

පී ඩබ්ලිව්.

---

දයාබර පීඩබ්ලිව්,

ප්‍රශ්නය අනෙක් පැත්තට ඇසුව හොත්, ජවිපෙ 'සියලු ජාතීන්ට හා ආගම්වලට සමානව ගරු කරන පක්ෂයකි' යයි ඔබ අවංකත්වයෙන් යුතුව කියා පාන්නේ කෙසේ ද? තමන්ගේ ආසන්න අරමුනු සඳහා ජවිපෙ වාචාලයන් ඒ ඒ වෙලාට තමන් පිලිබඳව බොහෝ දේ - සාමයේ සහයෝගීකරුවන්, ජාතීන් අතර සමාන බව ප්‍රකාශ කරන්නන්, සහ සමාජවාදීන් ලෙස පවා - කියා පා ඇත. එහෙත් යමෙකු පක්ෂයක් තමන් ගැන කියන දේ සරලව පිලිගෙන එහි ක්‍රියා මාර්ගය වාර්තාව විමර්ෂනය කිරීමට අසමත්වන්නේ නම් දේශපාලනයේ දී ඔහු මෝඩයෙකි.

1960 ගනන්වල දී ජවිපෙ සම්භවය පවත්නේ අතෘප්තියට පත් සිංහල ගැමි තරුනයන්ට අව්‍යාජ මාක්ස්වාදයෙන් නොව කැස්ත්‍රෝවාදී සහ මාවෝවාදී පාඨ ඇද බෑමෙන් සහ රැඩිකල් අධිරාජ්‍ය විරෝධී සටන් පාඨවලින් ඇසුරුම් කරන ලද ස්ටැලින්වාදයේ රූපාකාරයකින් ආයාචනා කිරීමේ ඔවුන්ගේ වැරවෑයම්වල ය. කෙසේ වෙතත් ආරම්භයේ සිට ම ඔවුන්ගේ ක්‍රියා මාර්ගය දෙමල විරෝධී ස්වෝත්තමවාදයෙන් පත්තියම්ව තිබුනි. ඔවුහු වතු කම්කරුවන් පස්වන කොලම හෙවත් 'ඉන්දීය ව්‍යාප්තවාදයේ' ඒජන්තයා ලෙස හංවඩු ගැසූහ.

1980 ගනන් අග දී ඔවුන්ගේ පරිනාමයේ තීරනාත්මක සංධිස්ථානයක් පැමිනුනේ ය. ජවිපෙ ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව විසකුරු උද්ඝෝෂනයක් ඇරඹී ය. මෙය ඉන්දීය හමුදා එවීම ඇතුලුව දිවයින මත සාම ගනුදෙනුවක් පැටවීමේ ඉන්දීය හා ලාංකීය පාලක පන්තිවල ඒකාබද්ධ ප්‍රයත්නයක් වී ය. ජවිපෙ සිය සමාජවාදී පූච්චානම් ඉවත දමා ශ්‍රී ලංකා ධනපති රාජ්‍යයේ දේශප්‍රේමී ආරක්ෂකයා ලෙස පෙරට පැමිනියේ ය. ඔවුන්ගේ උද්ඝෝෂනයට සහාය දීම ප්‍රතික්ෂේප කල කම්කරුවන් සහ දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කර දැමූ ජවිපෙ තමන් අතීතයේ ඉන්දීය ආක්‍රමනිකයන්ට විරුද්ධව සටන් වැදුනු පලමුවන විජයබාහු නම් සිංහල රජුගේ අනුගාමිකයා ලෙස හඳුන්වා ගත්තේ ය.

1994 දී ජවිපෙ නීති ගත කරන ලද නමුත් ඔවුන්ගේ මූලික දෘෂ්ටිවාදය අංශු මාත්‍රයකින්වත් වෙනස් වී නැත. 2000 දී මේ පක්ෂය ජනාධිපති කුමාරතුංගගේ ව්‍යවස්ථා සංග්‍රහයේ ඇතුලත්ව තිබූ දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා වූ සීමිත සහනවලට දෘඪතර ලෙස විරුද්ධවෙමින් බෞද්ධ ධූරාවලිය සමග පෙල ගැසුනේ ය. ඔවුන් බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස ඇටුවම් බැස්සවූ වර්තමාන ව්‍යවස්ථාව ආරක්ෂා කරයි. ඊනියා සාම ක්‍රියා දාමයට පවතින ජවිපෙ වෛරයට සමාජවාදයට සම්බන්ධවූ කිසිවක්ම නැති අතර එයට පදනම්ව ඇත්තේ ගර්හිත සිංහල උත්තමවාදයයි. සමාන අදහස් ඇති සංවිධාන සමග ජවිපෙ ජාතික කොඩිය හා බෞද්ධ කොඩිය සමග ''මවුබිම රැකගනිමු'' සටන්පාඨය යටතේ දේශ හිතෛශී ජාතික පෙරමුන සහ ජාතික සංඝ සම්මේලනය පිහිටුවී ය.

කේ රත්නායක.

෴ ෴ ෴

හොඳ වැඩ කොටසකි. ඔබ වැනි උදවිය නිසා ශ්‍රී ලංකාවට ඇගේ සාමකාමී පැවැත්ම යලි අත් කර ගැනීම ට තවම බලාපොරොත්තු තබා ගත හැක. පසු ගිය 50 වසර තිස්සේ දේශපාලකයන්, විශේෂයෙන් ම පාලක ප්‍රභූන් රට අවුල් කර දැකීම කනගාටුදායක ය. මම 1975 දී යහපත සොයා ශ්‍රී ලංකාව හැර ගියේ යලි නොඒමට දිවුරමිනි. ලසසප සහයෝගීකරුවකු ලෙස 1972 කොල්වින්ගේ ව්‍යවස්ථාවෙන් පසු මට සියල්ල එපා වී බලාපොරොත්තු සුන්වී ගියේ ය. කදිරගාමර් සැත්කමට පෙරාතුව ම මියගොස් සිටි බව අද මම දෙමල වෙබ් අඩවියක කියවීමි. සැඟවීම් හෝ විකෘති තොරතුරු සැපයීම සිදු විය. මෙම ආරංචිය කෙතරම් සත්‍යදැයි මම නොදනිමි.

එස් ටී.

---

කදිරගාමර් වෙඩි වැදීමට පෙර මිය ගියා යැයි කිව හැකි කිසිවක් අප දැක නැත. බොහෝ ඉහල පෙල අපරාධයන් පිලිබඳව සේ ම කුමන්ත්‍රන න්‍යායන් බහුලව තිබේ. සාමාන්‍යයක් ලෙස එවන් න්‍යායන් සම්බන්ධිත දේශපාලන කාරනා පැහැදිලි කිරීමට උදව් නො වේ.

ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සම්බන්ධයෙන් ගත්කල එහි පරිනාමයේ මූලික සන්ධිස්ථානය වූයේ බන්ඩාරනායක මැතිනිය ගේ ධනේශ්වර ආන්ඩුවට ඇතුල්වීමෙන් කල 1964 පාවාදීම ය. කොල්වින් ආර්. ද සිල්වා වැනි එහි නායකයින් සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම මුලුමනින් ම අතහැර දමා සිංහල වර්ගවාදී දේශපාලනය වැලඳගත්තේ ය. රාජ්‍යයේ ගමන්මග දක්වන දෘෂ්ටිවාදය ලෙස දෙමල විරෝධී වෙනස්කම් කිරීම කාවැද්දූ 1972 ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ දී ව්‍යවස්ථා සම්පාදන ඇමති ලෙසට ද සිල්වාගේ භූමිකාව තර්කානුකූල ප්‍රතිඵලය යි.

අපි අද දක්වාමත් ලසසප පාවාදීමේ පලවිපාක සමග ජීවත් වෙමු. 1960 ගනන්වල දී හා 1970 ගනන්වල දී ජවිපෙ එල්ටීටීඊ සතු පෙරලිකාරී තරුනයන්ට වර්ගවාදී දේශපාලනයේ පදනම මත ආයාචනා කිරීමේ හැකියාව උදා වූයේ පන්ති පදනමක් මත සියලුම

කම්කරුවන් එක්සත් කිරීමේ අරගලය හැර දැමීමේ කරුන නිසාවෙනි. ජවිපෙ සහ එල්ටීටීඊය ලසසපයේ සහ ඔවුන් හවුල්කාරයන් වූ ආන්ඩුවේ නීච ප්‍රතිපත්තිවලට ඇඟිල්ල දිගු කරමින් මාක්ස්වාදය ද ට්‍රොට්ස්කිවාදය ද හෙලා දුටුවෝ ය. අවසාන විශ්ලේශනයේ දී විසි අවුරුදු ව්‍යසනකාරී යුද්ධයට වග කිව යුත්තේ ලසසපයේ පාවාදීම ය.

මෙම දුෂ්කර තත්වයන් යටතේ දී සසප පූර්වගාමියාවන විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) පමනක් ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ එනම් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රතිපත්ති වෙනුවෙන් වූ අරගලය දිගටම ගෙන ගිය අතර ලසසපයේ පාවාදීමේ න්‍යායික හා දේශපාලනික පදනම කම්කරුවන්ට සහ තරුනයන්ට පැහැදිලිකර දීමේ ප්‍රයත්නයේ යෙදුනේ ය. අද සියලු ප්‍රධාන දේශපාලන පක්ෂ දිවයින ඇද දමා ඇති ගොහොරුවට සමාජවාදී විකල්පයක් සම්පාදනය කල හැකි ස්ථාවරයක සසප සිටිනුයේ එම අධිශ්ඨානශීලී අරගලය හේතුවෙනි.

කේ රත්නායක.

© www.wsws.org